# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 80 — 1973 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා — 1973.10.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... ... | 173 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | බුද්ධල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 174 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |



**සැළකිය යුතුයි.**—රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 28 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### බස්නාහිර පළාත

කොළඹ දිස්ත්‍රික් උසාවියේදීය

ආර් එම්. ඒ ආර්. ඒ ආර්. වී ආර්. වීරප්පා චෙට්ටියාර්, අංක. 245, හෙට්ටි වීදිය, කොළඹ, ............................................ පැමිණිලිකරු.

අංක : 28391/එස් එදිරිව

පී. සුප්‍රමනියම් චෙට්ටියාර්, මහකන්ද එස්ටේට්, පේරාදෙණිය සහ 266, හෙට්ටි වීදිය, කොළඹ ...... ............................ විත්තිකරු.

පහත උපලේඛනයේ සඳහන් දේපලට මෙම නඩුවෙහි විත්තිකරුට ඇති සියලු අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1973 ක් වූ නොවැම්බර් මස 15 වෙනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වනු ලැබේ. මෙම වෙන්දේසිය පවත්වනු ලබන්නේ ඉහත සඳහන් නඩුවේ විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතුව ඇති රු. 25,952.50 ක් සහ රු. 24,000 කට 1966.12.07 වැනි දින සිට එම ගණන ගෙවා නිම වනතුරු වර්ෂයට සියයට 9 බැගින් පොලිය ද නඩු ගාස්තු වශයෙන් රු. 889.73 ක්ද අයකර ගැනීම සඳහාය. මේයට අමතරව පවුන්ඩේජ් ආදියද ගෙවීමට සිදුවෙනවා ඇත.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාතේ කඳුකර පහළ කෝරළේ හිඳගල ගමේ පිහිටා තිබෙන මහ කන්ද වත්ත නමැති ඉඩමේ (කලින් හිඳගල වත්ත නමින් හැඳින්වූ) බෙදා වෙන් කළ කොටසක් වන 1969 ජනවාරි මස 29 වෙනි දින ඒ. බී. කිරිදෙන බලයලත් මිනින්දෝරු මහත්මයා විසින් මැන සාදන ලද අංක: 27 තේ ප්ලෑනේ සඳහන් ලොට් අංක 5 මායිම්—උතුරට: දොල සහ ලොට් අංක 11 (දැනට පාරද) නැගෙනහිරට: ලොට් අංක 6, දකුණට: මහකන්ද වත්තේ ඉතිරි කොටස වන එච්. සී. පීරිස් මහත්මයාට විකුණූ කොටස, බස්නාහිරට: ලොට් අංක 4 දරණ බිම් කැබැල්ල යන හතර මායිම් තුළ පර්චස් තිස්අටක් විශාලත්වය ඇති (අ. 0, රූ. 0, පර්. 38) බිම් වාසිය වේ. තවද මෙම බිම් කැබැල්ල ගම්පොල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී/157/18 ලියාපදිංචිවී තිබේ.

2. මධ්‍යම පළාත් මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාතේ කඳුකර පහළ කෝරළේ හිඳගල ගමේ පිහිටා තිබෙන මහ කන්ද නමැති ඉඩමේ (කලින් හිඳගල වත්ත නමින් හැඳින්වුන) බෙදා වෙන් කළ කොටසක් වන 1969 ජනවාරි 29 වෙනි දින ඒ. බී. කිරිදෙන බලයලත් මිනින්දෝරු මහත්මයා විසින් මැන සාදන ලද අංක 27 තේ ප්ලෑනේ සඳහන් ලොට් අංක: 6 යේ බිම් වාසියට මායිම්—උතුරට දොල සහ අංක 11 දරණ දැනට පාරද, දකුණට: මහකන්ද වත්තේ ඉතිරි කොටසද, එච්. සී. පීරිස් මහත්මයාට විකුණූ කොටස, නැගෙනහිරට: ලොට් අංක 7 දරණ කොටසද, බස්නාහිරට: ලොට් අංක 5 දරණ යන සතර මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාලත්වය ඇති බිම් වාසිය වේ. තවද මෙම බිම් කැබැල්ල ගම්පල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී/157/187 පොතේ ලියාපදිංචි තිබේ.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම මකලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

173—3 71025 — 5,682 (73/10)

D 1

මෙම කාරණය 1973 ක්වූ පෙබරවාරි මස 17 වෙනි දින පෙත්සම්කාරී වෙනුවෙන් ඇම්. හුසේන් බාරි මහතා පෙනී සිටියදී ගාල්ලේ දිසා විනිශ්චයකරුවූ එල්. එච්. ද අල්විස් මහතා ඉදිරියේදී විභාගයට ගෙන ඉහත නම් සඳහන් පෙත්සම්කාරියගේ 1973 ක්වූ ජනවාරි මස 25 වෙනි දින දරණ දිව්රුම් පත සහ 1973.01.26 වැනි දින දරණ පෙත්සම කියවාබලා ඉහත නම් සඳහන් 9 වෙනි වගඋත්තරකරු 6, 7 සහ 8 වෙනි බාලවයස්කාර වගඋත්තරකරුවන්ගේ මෙම නඩුවේ භාරකාරයා වශයෙන් පත්කිරීමට නියම කරන ලදී.

තවද ඉහත නම් සඳහන් පෙත්සම්කාරි එම නැසීගිය තැනැත්තාගේ වැන්දඹුව වශයෙන් සහ එම බූදලයේ අයිතිකාරියක් වශයෙන් එම නැසීගිය තැනැත්තාගේ බූදලයේ බලකාරිය වශයෙන් මෙයින් පත් කරන්ට යෙදුනා ඇත.

තවද මෙම පත් කිරීමට විරුද්ධව යම්කිසි තැනැත්තෙකුට කරුණු කියන්ට තිබේනම් ඔහු විසින් එසේ සෑහෙන කරුණු වර්ෂ 1973 ක්වූ ජූනි මස 1 වෙනි දින පෙරවරු 9 ට මෙම උසාවියට පැමිණ කියා සිටිය යුතුය. එසේ නොකල හොත් මේ පත්කිරීම ස්ථිර කරනු ලැබේ.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස්,
දිසා විනිශකරු, ගාල්ල.

1973 ක්වූ පෙබරවාරි මස 17 වැනි දින දී ය.

හේතු දක්වීමේ දිනය 1973.7.20 දිනය දක්වා දීර්ඝ කරන ලදී.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස්,
දිසා විනිශකරු, ගාල්ල.

1973.6.4.

**හේතු දක්වීමේ දිනය : 1973.7.20 දිනය දක්වා දීර්ඝ කරන ලදී.**

එල්. එච්. ද අල්විස්,
දිසා විනිසුරු, ගාල්ල.

1973.7.20.

**10–193—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය**

**නයිසයි ආඥාව**

ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේදීය

ගාල්ලේ, වක්වැල්ල පාරේ අංක. 194 නිවසේ පදිංචිව සිට නැසීගිය ආර්ලින් ද සිල්වා විජේරත්නගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලය ගනයි. මියගිය අය.

ගාල්ලේ වක්වැල්ල පාදේ අංක 194 නිවසේ පදිංචි ප්‍රෙඩ්රික් ආතර් ද සිල්වා විජේරත්න ............................ පෙත්සම්කරු.

අංකය : ටී. 9387.

සහ

(1) ගාල්ලේ වක්වැල්ල පාරේ අංක. 194 නිවසේ පදිංචි ගාමිණී ද සිල්වා විජේරත්න (2) ගාල්ලේ රිච්මන්ඩ් කන්ද පාරේ අංක 257 නිවසේ පදිංචි චිත්‍රා ප්‍රේමරත්න විවාහයට පෙර විජේරත්න.

පූර්වෝක්ත පෙත්සම්කරු වෙනුවෙන් ජේ. ද ඇස්. විජේරත්න නීතිඥ මහතා පෙනී සිටියදී වර්ෂ 1973 ක්වූ ජූලි මස 19 වෙනි දින ගාල්ලේ දිසා විනිසුරු තැන්පත් ඇල්. එච්. ද අල්විස් මැතිතුමා ඉදිරිපිටදී මෙම කාරණය ප්‍රදුස්සක් කිරීම සඳහා ගෙන පෙත්සම්කරුගේ 1973 ජූලි මස 19 වෙනි දින දරණ දිවුරුම් පත සහ පෙත්සමද කියවා බලා,

පූර්වෝක්ත වගඋත්තරකරුවන් හෝ මෙම බූදලය පිළිබඳව සැලකිල්ලක් දක්වන්නකු හෝ දක්වන්නන් වර්ෂ 1973 ක්වූ ඔක්තෝබර් මස 19 වෙනි දින හෝ එදිනට ප්‍රථම මෙම උසාවියට ඒත්තුයනාකාර සෑහෙන විරුද්ධ වාදිකම් ඉදිරිපත් නොකළ හොත්,

පූර්වෝක්ත පෙත්සම්කරු ඉහත නම් සඳහන් නැසීගිය අයගේ පුරුෂයා වශයෙන් යථොක්ත බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ඔහු වෙත පවරා දීමට යෙදෙන බව මෙයින් නියෝග කරන්නට යෙදුනා ඇත.

ඇල්. එච්. ද අල්විස්.
දිසා විනිසුරු.

1973 ක්වූ ජූලි මස 19 වෙනි දින,
ගාල්ලේදීය.

**10–203—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය**

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ නොහොත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගෙවුදෙනු කාලය අවසන්වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. වයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනගේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ලංකාවියේ අඩ පනත් යටතේ නිකුත් කළායයි නැගෙන ප්‍රකාශන, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... .. | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරම යෙදෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළවලින් වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන්නට එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

**සාමාන්‍යයෙන් ගැසට් පත්‍රය— වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ කිසි වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට වඩා අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ඔක්තෝබර් ... | 5.10.73 | සිකුරාද ... | 28. 9.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 12.10.73 | සිකුරාද ... | 5.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 19.10.73 | සිකුරාද ... | 12.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 26.10.73 | සිකුරාද ... | 19.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| නොවැම්බර් ... | 2.11.73 | සිකුරාද ... | 26.10.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 9.11.73 | සිකුරාද ... | 2.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 16.11.73 | සිකුරාද ... | 9.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 23.11.73 | සිකුරාද ... | 16.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 30.11.73 | සිකුරාද ... | 23.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| දෙසැම්බර් ... | 7.12.73 | සිකුරාද ... | 30.11.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 14.12.73 | සිකුරාද ... | 7.12.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 21.12.73 | සිකුරාද ... | 14.12.73 | සිකුරාද | දහවල් 12.00 |
| | 28.12.73 | සිකුරාද ... | 21.12.73 | සිකුරාද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. ඕ. පීරිස්**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.